# සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව

## නිවාඩු කාලීන පැවරුම - 03 වන සතිය - බුද්ධ ධර්මය - 4 ශ්‍රේණිය

සැකසුම - එම්.වී.සම්පත් බන්දු ගුණසේකර - ර/බළ/වෙළගපොළ විද්‍යාලය

### වාචික කොටස

1. බුදුරජාණන් වහන්සේ විසින් පිහිට වූ අසරණ පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් කියන්න.
2. පූතිගත්ත තිස්ස තෙරුණ්ට ඇති වූ රෝගය විස්තර කරන්න.
3. තිස්ස තෙරුණ්ට පූතිගත්ත තිස්ස යන නම පටබැඳුණේ ඇයිදැයි විස්තර කරන්න.
4. තිස්ස තෙරුණ්ට බුදුරජාණන් වහන්සේ උපස්ථාන කළ ආකරය විස්තර කරන්න.
5. කිසාගෝතමියගේ පුතාට සිදුවූ කරදරය කුමක්ද?
6. දරුවා රැගෙන ඇවිද යන ගෝතමියට මිනිසුන් දුන් පිළිතුර කුමක්ද?
7. කිසාගෝතමියට මුණගැසෙන ගුණවත් මිනිසා දුන් උපදෙස කුමක්ද?
8. කිසාගෝතමියට පිහිට වීමෙන් බුදුරදුන් තුළ දැකිය හැකි ගුණාංග දෙකක් කියන්න.
9. ඇයට අබ රැගෙන ඒමට නොහැකි වූයේ ඇයි?
10. අබ සොයා ගැනීමට නොහැකි වීම නිසා කිසාගෝතමියට අවබෝධ වූයේ කුමක්ද?

### ලිඛිත කොටස

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1.කිසාගෝතමිය ජීවත් වූයේ කොහේ ද?

1. රජගහනුවර 2. සැවැත් නුවර 3. කිඹුල්වත් පුර 4. සේනානි නියම්ගම

2.පූතිගත්ත තිස්ස තෙරුන්ගේ ගිහි නම වූයේ,

1. යස 2. කාළුදායි 3. තිස්ස 4. ආනන්ද

3.කීසාගෝතමියට පිහිටවන විට බුදුරදුන් වැඩ සිටියේ ,

1.ජේතවනාරාමයේ ය 2. වාලුකාරාමේ ය 3. පූර්වාරාමය 4. කූටාගාර ශාලාවේය

4. කිසාගෝතමිය මළ දරුවා දමා ගියේ ,

1.පාරේය 2. කැලයකය 3. කාණුවකය 4. සොහොනකය

5. තිස්ස තෙරුන්ට පිහිට වී මතුළින් බුදුරදුන් තුළ දැකිය හැකි ප්‍රධාන ගුණාංගය වන්නේ

1. තැනට සුදුසු නුවණ 2. කරුණාව 3. ඉවසීම 4. නායකත්වය

- හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. පූතිගත්ත තිස්ස තෙරුන් ගිහි කළ ජීවත් වූයේ ................ ය. (රජගහනුවර/සැවැත් නුවර)
2. බුදුරදුන්ගේ උවැටනින් පසු තිස්ස තෙරුන්ගේ සිත හා .................සුවපත් විය. (හිස / කය)
3. තිස්ස තෙරුන්ගේ ශරීරයේ මුළුන්ම හටගත්තේ .............. ය. (තුවාල / බිබිලි)
4. කිසාගෝතමියගේ පුතා .................. . (රෝගාතුර විය / මියගියේ ය)
5. කිසාගෝතමියට බුදුරදුන් විසින් රැගෙන ඒමට කීවේ ................................. ය. (අඹ / අබ)